## සන්නසයි අපියි

පාඨක රුචිය වඩවන ලිපි අසමානයි
මසකට වරක් මනසට අහරක් ගානයි
පඳුරට නොවේ නිසි එල්ලෙට හී මානයි
සන්නස අපේ තව කල් වැජඹෙනවාමයි

හැමදාකදිම උණුසුම හදවතට දෙන
සන්නස තරම් පත්තරයක් නැතිය වෙන
රස පිරි දැනුම පිරි ලිපි දෝතටම ගෙන
මතු මතුවටත් වැජඹෙනු පුන් සඳක් මෙන

සන්නස නිසා මතුවුණ මිණි කැට වාගේ
ලේඛක පරපුරේ නම් සිහියට එයි මාගේ
කරනා අයත් කියවන අප හා දීගේ
නොනැසී තියෙයි සැමදා යදමක් වාගේ

**අසන්ත අමරකෝන්**
එසෙන්ඩන්

## සුබ පැතුම

නිහැඬියා බිඳගෙන
මනුෂ්‍යත්වයේ නාමයෙන්
සමාජයට, රටට , දැයට
අංශු මාත්‍රයකින් හෝ
මෙහෙවරක් උදෙසා
සත්‍යයේ හඬ නඟන්නට
පෑනට කොලයට
අත පොවන්නට
පන්නරයක් වූ
සන්නසට සුභ උපන්දිනයක් පතමි

**සුජීවා ලෝගුස්**

## සන්නස සදා දිනේවා

විදේශගතව සිටිනා අපට සිංහලෙන් කියවිය හැකි පුවත්පතක් යනු වටිනා වස්තුවකි. අපේ පාලුව කාන්සිය මගහරවන්නටත් දැනුම හා විනෝදය සපයන්නටත් පුවත් පත් වලට හැකියාව ඇත. ඔස්ට්‍රේලියාවේ පළවන සන්නස පුවත්පත මේ සියලු කාරණා අතින් ඉදිරියෙන්ම සිටින බව නිර්භයව ප්‍රකාශ කළ හැකිය.

අවශ්‍ය තැනදී එඩිතරව අදහස් ප්‍රකාශ කරන දක්ෂ ලේඛක ලේඛිකාවෝ රැසක් සන්නසේ සිටිති. ඩී බී කුරුප්පු මහතා එස් පියසේන මහතා ශ්‍යාමන් ජයසිංහ මහතා වි ක ධර්මබන්ධු මහතා වැනි වැඩිහිටි පරපුරේ අදීන ලේඛකයන් සන්නස හා එක්ව සිටීමෙන් එහි වටිනා කම තවත් වැඩි වෙයි.

සන්නස සදා දිනේවායි පතමු.

**එන්. විජේසේකර**
ග්ලෙන්වේවලි

## සන්නස දිනේවා යි සුබ පැතුම් අපෙන්

**අමාලි හා සිසිර ගල්හේන**
**ඩැන්ඩිනොන්**

## සන්නස *Dynamic* පත්තරයකි.

සන්නස Dynamic පත්තරයකි. මොන මොනවා හෝ ලිපි ටිකක් දමා පුරවන පත්තරයක් නොවේ. සැමවිටම සමාජය දෙස අවදියෙන් බලා සිටියි. ඉදිරිපත් විය යුතු තැනදී ඉදිරියට එයි. කතා කළ යුතු දේ නිර්භයව කතා කරයි. ඔබ අපට ශක්තියක් වනවා සේම ඔබ සමග අප ද සිටින බව දන්වමු. ඉදිරියටම යන්නට සුබ පතමි.

**අජිත් කුමාරවංශ**
රෙසවෝ වික්ටෝරියා

# පස් වසර සැමරූ සන්නස

## සාලිය ගලප්පත්ති

*- සන්නස ආරම්භක කැඳවුම්කරු*

ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර එලිවෙන යාමය මව්බිමේ තවත් වූ එලිවෙන යාමයකට අතිශයින් සමානය. අළුත් දෙයක් වැදගත් දෙයක්, දෝලනය හා ආන්දෝලනය අතර හිරව තවත් ගුප්ත දෙයක් සමඟ එලිවෙන යාමයක් නැහැයි කීවොත් එය මුසාවෙකි. මුලාවෙකි.

දහස් සංඛ්‍යාත උගතුන්, බුද්ධිමතුන්, වියතුන්, ගෞරවනීය මිනිසුන්, නොමිනිසුන්ගෙන් පිරුණු මේ පුංචි මෙල්බන් වල ජීවත් වූ මා හෙවත් සාලිය ගලප්පත්ති මෙම රටට පැමිණියේ 1992 වසරේදීය. දිනෙන් දින වියපත් වන ජීවිතය නිස්කාරණයේ ගෙවා දැමීම මට අසීරු අම්හිරි කරුණක් විය. මම 1994දී 3zzz ගුවන් විදුලියේ සාමාජිකත්වය ලබා ගතිමි. එකල එහි කැඳවුම්කරු වූයේ බන්දු දිසානායක මහතාය. මෙම ගුවන් විදුලිය වටා ඒකරාශි වූ මිනිසුන්ගේ මතවාදී සංහිඳියාව තුලින් කණ්ඩායම් බිහි විය. මා අපේක්ෂා කළ කණ්ඩායමට, මගේ හදවතට, මනසට, හිතවත් අපූරු සුන්දර මිනිසා මා අභියස රූස්ස ගසක් හිටවූවාසේ පෙනෙන මිනිසෙකු විය. ඒ ජගත් ජේ. එදිරිසිංහ නම් ලේඛකයාය. ඔහු එකල SERENDIB නම් පුවත්පතේ සිංහල පිටු වල කතුවරයාය. මෙකල මට හමු වූ තවත් අපූරු ගෞරවනීය මිනිසෙක් නම් විජය කරුණාසේනය. සංසාර ගමනේ ගෞරවනීය පූජ්‍යත්වයට පත් උතුම්වූත් උත්තරීතරවූත් හිමිනමක් වූ කීස්බරෝ ධම්ම සරණ විහාරයේ නාඹටුන්නේ විජිත හිමි මා හට දැන උගත්කම් අවවාද අනුශාසනා දුන් හිමිවරයෙක් විය.

මම සෙරන්ඩිබ් පුවත්පතට ලිපි සම්පාදනය කිරීමට පටන් ගත්තෙමි. ඉන් ටික කලකට පසු ජගත් සොයුරා වරුණ සාවින්ද සොයුරා සමඟ පහන පුවත්පත ආරම්භ කළේය. එකල මෙල්බර්න් පුවත්පත් කලාවේ ස්වර්ණමය යුගය කීවොත් නිවැරදි යයි මට සිතේ. මා අතින් නිර්මාණය වූ ලිපි ගොන්න මෙල්බර්න් ඇතුළු ඕස්ට්‍රේලියාව පුරා ප්‍රචලිත විය. මට උද්යෝගය ධෛර්‍යය ඉහත තිදෙනාගෙන් ලැබුණායයි කීවොත් නිවරැදිය. නමුත් අවාසනාවකට පහන පුවත්පත විකුණා දමන ලදි.

ජගත් සොයුරා ඇතුළු අපි සියළු දෙනා කතා කළෙමු. මෙකල මව්බිමේ ජාති හිතවාදී රජයෙන් බිහිවූ අපෙන් මව්බිමට යමක් කළ යුතුය යන අදහස අප තුළ විය. ඒ යටතේ මව්බිමේ වැව් දස දහසේ ව්‍යාපෘතියට උදව් උපකාර කිරීමේ අටියෙන් සැඳුම්ලත් කමිටුවේදී මගේ ජීවිතයට, අදහස්වලට, සංකල්පනාවට හිතකාරී තවත් සුන්දර මිනිසෙකු හමුවිය. ඒ අසෝක සුභසිංහ නම් සහෝදරයාය.

ආනන්ද කුමාරසිරි, අසෝක සුභසිංහ සහ මම පුවත්පතක් ආරම්භ කළ යුතුය යන මතයට එක් වුණෙමු. අළුත් පුවත් පතක් මෙල්බර්න් නුවරට ඇතුළු ඕස්ට්‍රේලියාවට අවශ්‍ය මොහොත එළැඹ ඇති බව මම ඔවුනට කීවෙමි. ආනන්ද කුමාරසිංහ හරහා ඔහුගේ හිතවතෙකු වූ ලංකා පුවත්පතේ විරංජන හේරත් සමගද සම්බන්ධ වුණෙමු. සන්නස ලංකාවේ නිර්මාණය කර ලංකාවේම මුද්‍රණය කර Borodmeadows හි කපිල සොයුරා හරහා ගෙන්වීම එක් යෝජනාවක් විය.

නමුත් මා ප්‍රකාශ කළේ ඕස්ට්‍රේලියාවට ආවේණික පරිසරයට ආවේණික මුහුණ වරක් පුවත්පත තුලින් විකාශනය වීමත් අපේ පොකට්ටුවට සාධාරණ වීමත් සිදු විය යුතු බවයි. ඒ තත්වය තුල මගේ යෝජනාව වූයේ ජගත් ජේ. එදිරිසිංහ සොයුරා මෙයට සුදුසුම උරුම පුදුගලයා බවයි. ඉන් අනතුරුව අපි ජගත් අයියාගේ Broadmeadows ගෙදරට ගොස් ඔහු නම්මා ගන්නට උත්සාහ කළෙමු. මේ කාලයේදී ඔහු පහන පුවත්පත අහිමි වීමෙන් මහත් කළකිරීමට පත්ව නිහඬව සිටියේ ය. ඔහු හමු වු මුල් දවසේම ඔහු ප්‍රකාශ කලේ "සාලිය මම උදව් කරන්නම්... ඔයාල කරගෙන යන්න" කියාය. දෙවන දවසේ කීවේ "මම ලිපියක් දෙකක් දෙන්නම්" කියාය. ඇවිටිලි කිරීම් වල ඉවක් බවක් නොමැති තැන ඔහු කතෘවරයා වීමේ වගකීම භාර ගත්තේය. ඉන් අනතුරුව මා සිතුවේ පුවත්පතේ පදනම ගැනයි. එහි ඵලය වූයේ ජගත් අශෝක ආනන්ද සහ මා යන අප සතර දෙනාගේ මූලිකත්වයෙන් පුවත්පත ආරම්භ කිරීමයි.

පුවත්පත නිර්මාණය කිරීමේ යථාර්ථවාදී සංකල්ප, ගෞරවනීය මෙහෙවර සහ අරගලය තුළ මා නායකත්වය ගත්තෙන් මම පුවත් පතේ මුල් කැඳවුම්කරු වූයෙමි. පසුව ජගත් ජේ. එදිරිසිංහ සොයුරාත් අද අසෝක සුබසිංහ සොයුරාත් හරහා ඉදිරියට යන සන්නස අධිෂ්ඨානයේ සංකේතයක් බවට පත්ව ඇත.

කෙසේ වෙතත් සන්නසේ අද දක්වා කාර්යභාරයේ දී නොසැලෙන ශක්තියක් ලෙස ජගත් සහ අසෝකත් සමඟ ගෞරවනීය සොයුරකු ලෙස සිටින හිතාදර ශ්‍රීනාත් මද්දුමගේ සොයුරා කෙදිනකවත් අමතක නොවන සොයුරකි.

ජීවිතය අවිනිශ්චිතය. සියල්ල අනිත්‍යය නමුත් නාමය නිශ්චිතය. චන්ඩමාරුත වියළි සුළඟ ඉදිරියේ නොසැලී නොබියව තම නාමය සතු කීර්ති භක්තිය සද සුරැකී නම් එය සන්නසය.

පක්ෂග්‍රාහී නොවන කාටත් සාධාරණ සේවාවක් සලසන, අරමුණක් නිශ්චිත වේදිකාවක් ඇති සන්නස දිනේවා. ඔබට දීර්ඝායුෂ.

## සන්නස ට වසර පහක් සපිරෙයි

## උණුසුම් වසර පහක ගමන් මග



### සන්නස

පියවරෙන් පියවර
ඇදෙන ඉදිරියටම
පස් වසක් සමරණ
සන්නස කුමරිය
රුවෙන් දිලෙනා
ගුණෙන් අගනා
සෙනෙහසින් අප
සිත් සනසවනා
ගල් මුල් ද
කටු පඳුරු හා බාධකද
මැඩ ඉදිරියටම යන්නට
ශක්තියත් ධෛර්යයත්
නොඅඩුව ලැබෙන්නයි
මේ සුබ පැතුම
හද පිරුණ
සෙනෙහසින්

**සුවිනී අබේකෝන්**
පැරමටා
නිව් සවුත් වේල්ස්

## සන්නස බුද්ධිමත්

ජනසන්නිවේදනය යනු අධ්‍යයනයකින් ඉගෙන ගත යුතු දෙයක් සන්නස ජනසන්නිවේදන මාධ්‍යය පිළිබඳ මනා වැටහීමකින් යුතු පුවත්පතක් ලෙස ශ්‍රී ලංකාවේ ජන සන්නිවේදනය පිළිබඳව හදාරා තියෙන කෙනෙක් හැයට මම හඳුනාගෙන තියෙනවා. කෙටි කාලයකට මෙල්බන් නගරයට ආ මට මෙහි ඇති බොහෝ මාධ්‍ය පිළිබඳව පැහැදීමක් නැහැ. ඒ බොහෝ මාධ්‍යවල මූලිකත්වය ගෙන සිටින්නන්ට ජන සන්නිවේදනය පිළිබඳ අවබෝධයක් තියෙන බවක් පේන්නෙ නැහැ.

සන්නස ඔස්ට්‍රෙලියාවේ විතරක් නෙවෙයි ලංකාවෙන් පිටත රටවල් ගත්තත් බොහෝ ඉදිරියෙන් සිටින පුවත්පතක් බව කියන්න මම පසුබට වෙන්න නැහැ.

**එස් කේ අමරසේකර**
ක්ලේටන්

ඉඩ ඇති නිසා හැමටම එය රන්වන් ය
හිස් බස් නොවේ අරුතින් ඔබ පිරිපුන් ය
සන්නස ඔබේ සේවය නම් මනරම් ය
පෙරටම යන්න හදපිරි සුබ පැතුමක් ය

**හේමමාලි බණ්ඩාරනායක**

## සන්නසට සුබ පතමි

ඉතාලියේ වියානා නගරයේ වාසය කරන මම සෑම මාසයකම සන්නස අන්තර්ජාලයෙන් කියවන පාඨකයෙක්මි. අන්තර්ජාලයෙන් අපට කියවන්නට ලැබෙන සිංහල පුවත්පත් අතරින් සන්නස ඉතාම සිත්ගන්නා සුලු පුවත්පතක් බව නොකියාම නොහැකිය. වසර පහක් තිස්සේ පවත්වාගෙන යනු ලබන සන්නස තවත් කාලයක් කියවන්නට අපට වාසනාව ලැබේවායි පතමි. සන්නස ගෙනෙන්නට වෙහෙසෙන ලේඛක ලේඛිකාවනට අපේ ස්තුතිය මෙසේ පිරිනමමු.

**අයේෂා කුමාරප්පෙරුම**
ඉතාලිය




සන්නසට සුබ පතා ලැබුණ සියලු සුබපැතුම් සඳහා ඉඩක් ලබා දීමට පුවත්පතේ සීමිත වපසරිය ඉඩ නොදෙයි. සුබ පැතුම් එවූ සැමට ස්තුතියි. ඔබ අපට ශක්තියක්
සන්නස වෙබ් අඩවියට www.sannasa.net ගොඩ වී Archive කොටසට ඇතුල් වීමෙන් ඔබට සන්නස වසර පහක පසුගිය කළාප සියල්ල කියවන්නට හැකි ය. මේ සේවාව සපයන සිංහල ජූක් බොක්ස් www.sinhalajukebox.org වෙබ් අඩවියටත් ස්තුතියි

- සංස්කාරක